# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

## පුරප්පාඩු

**2008 අංක 35 දරන පනත යටතේ ස්ථාපිත කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**රැකියා විස්තරය:**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ අධිකාරියට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.

## 1. කළමනාකරු (නීති) HM 1-1- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**
**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**
**සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධියක් සමග ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

**සමග**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

## 2. කළමනාකරු (පාලන හා මානව සම්පත් සංවර්ධන) HM 1-1- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**
**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**
**සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය /රාජ්‍ය කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය/වාණිජ්‍ය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ වෙනත් උපාධියක් ලබා තිබීම.

**සමග**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

## 3. කළමනාකරු (මෙහෙයුම්) - HM 1-1- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**
**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**
**සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිසර විද්‍යාව/ධීවර හා සාගර විද්‍යාව/ සමුද්‍රීය සම්පත් කළමනාකරණය /වෙරළ සහ සමුද්‍රීය සම්පත් කළමනාකරණය/පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය/ කෘෂි විද්‍යාව/ව්‍යාහාරික විද්‍යාව/ජීව විද්‍යාව /සත්ව විද්‍යාව සහ ධීවර කටයුතු/ ජෛව තාක්ෂණය/ ජලජ සම්පත් තාක්ෂණය/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**සමග**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

## 4. කළමනාකරු (සැලසුම්) - HM 1-1- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**
**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**
**සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව /ගණිතය /වාණිජ්‍ය/ සංඛ්‍යානය/ සමුද්‍ර කටයුතු /පරිසර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සමග**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**පොදු:**

**01. සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.

**02. වයස :** අවු.35ට නොඅඩු හා අවු.55ට නොවැඩි විය යුතුය.

**03. වැටුප් පරිමාණය :** HM 1-1 : (රු.80,295 - 15X2,270 - රු.114,345)

**04. සුදුසුකම් ලබන දිනය :**

සේවයට/තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

**05. පත්වීමේ ස්වභාවය:**

තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදල (EPF) වෙනුවෙන් සේවකයා විසින් ගෙවනු ලබන 10% ට අමතරව අධිකාරියේ 15% ක දායකත්වයක් සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක අමතර දායකත්වයක් ලබා දෙනු ලැබේ.

**06. අයදුම්පත්‍ර එවීම :**

1. අයදුම්කරුවන් තම අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක තනි පැත්තට සකස් කර මුල් පිටුවේ තම පෞද්ගලික විස්තරද, දෙවන පිටුවේ අධ්‍යාපන සුදුසුකම්ද, තෙවන පිටුවේ වෘත්තීය සුදුසුකම් සහ රැකියා පළපුරුද්ද ද, සිව්වන පිටුවේ බාහිර ක්‍රියාකාරකම් ද ඇතුළත් කර ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සහිතව අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය.
2. මෑතකදී ලබාගත් චරිත සහතික 2ක්, ග්‍රාම නිලධාරි සහතිකය, පොලිස් වාර්තාව, ජාතික හැඳුනුම්පත, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතිකවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා සම්පූර්ණ කළ අයදුම්පත් **2024.06.13 වෙනිදාට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.** සම්මුඛ පරීක්ෂණය සඳහා ජාතික හැඳුනුම්පත සහ ඉහත ඡායා පිටපත් මගින් ඉදිරිපත් කරන ලද සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
3. තනතුරු කිහිපයකට අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
4. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය.
5. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, අදාළ සහතික වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපෑලෙන් අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ අප අධිකාරිය වගකියනු නොලැබේ.

**සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,**
**අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**2024.05.31**